**මොරටුව විශ්වවිද්‍යාලය - 2018**

---

## 1.1 තත්ත්වාගණනය කළ මතය

මොරටුව විශ්වවිද්‍යාලයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමග සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108(1) වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, විශ්වවිද්‍යාලයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විශ්වවිද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය විශ්වවිද්‍යාලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, විශ්වවිද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

----------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස විශ්ව විද්‍යාලයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ විශ්වවිද්‍යාලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, විශ්වවිද්‍යාලය ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන
------------------

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය
--------------------------------------------------------------------

ගනුදෙනු කළමනාකාරිත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම
----------------------------------------------------------------------

**පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.**

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ස්ථාවර වත්කම්වල දැක්වෙන පුස්තකාල පොත් 2013 වර්ෂයෙන් පසුව භෞතිකව පරීක්ෂණයක් සිදුකර නොමැත. තවද ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 65 ඡේදය පරිදි ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු. 276,364,317 ක් වූ දේපළ, පිරියත හා උපකරණ 2018 දෙසැම්බර් 31 දිනට සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත්, තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ හේතුවෙන් ප්‍රයෝජනාත්මක ජීවිත කාලය තක්සේරු කිරීමේදී වූ දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. | පුස්තකාල පොත් ජංගම නොවන වත්කම් යටතේ අවසාන ගිණුම්වල නිරූපනය කිරීම සම්බන්ධයෙන් 139 වන මුදල් කමිටුවේදී සාකච්ඡා කල අතර එහිදී ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 අනුව පුස්තකාල පොත් පිරිවැය ආකෘතිය අනුව ( Cost Model) අවසාන ගිණුම්හි නිරූපනය කිරීම සඳහා නිර්දේශ කළ අතර 457 වන පාලක සභාව මඟින් එය අනුමත කරන ලදී. මෙම සම්බන්ධයෙන් වන හෙළිදරව් කිරීම් ගිණුම් ප්‍රතිපත්ති යටතේ අංක 17 හි සිදු කර ඇත. පුස්තකාල පොත් ක්ෂය කිරීම සම්බන්ධ ගිණුම්කරණ ප්‍රතිපත්තිය වෙනස් කිරීමක් සිදු කර නොමැත. | ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කිරීමට පියවර ගත යුතු වීම . |

| | | |
|---|---|---|
| (ආ) විශ්වවිද්‍යාලය විසින් බාහිර ආයතනයකට විරුද්ධව රු.මිලියන 05 ක වන්දි ඉල්ලා මොරටුව දිස්ත්‍රික් අධිකරණයේ නඩුවක් පවරා ඇති අතර එම නඩුවේ විත්ති පාර්ශවය විසින් එම නඩුව සම්බන්ධව මහාධිකරණයට ඇපෑලක් ඉදිරිපත් කර තිබුණි. මේ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 08 හි 100 වගන්තිය අනුව හෙළිදරව් කිරීමක් සිදු කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නැත. | ප්‍රමිතයට අනුව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීම් කල යුතුවීම. |

**1.5.3 ගිණුම්කරණ අඩුපාඩු**
-------------------------

| විගණන නිරීක්ෂණය<br>---------------------------- | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම<br>------------------------------------------ | නිර්දේශය<br>------------- |
|---|---|---|
| නඩත්තු ගබඩාවෙහි 2018 දෙසැම්බර් 31 දිනට පවතින තොගය සත්‍යාපනය කර, වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි. | නඩත්තු ගබඩාවේ 2018.12.31 දිනට පවතින තොග වටිනාකම 2019 වර්ෂයේ ගිණුම්ගත කිරීමට පියවර ගනු ලබන බව. | තොගය සත්‍යාපනය කිරීමේදී උප ගබඩා තොගය ද අවසන් තොගයට ඇතුළත් කළ යුතු වීම. |

**1.5.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**
----------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විෂයය<br>------- | මුදල<br>----------<br>රු. | නොසැපයූ විගණන සාක්ෂි<br>--------------------- | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම<br>-------------------- | නිර්දේශය<br>----------- |
|---|---|---|---|---|
| (අ) වෙනත් ලැබීම් | **6,951,712** | මුදල් ප්‍රවාහ ප්‍රකාශනයෙහි මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ දක්වා තිබුණ රු.6,951,712 ක් වූ වෙනත් ලැබීම්වල ශුද්ධ වටිනාකම සනාථ කරන උපලේඛනය හෝ අදාල සාක්ෂි. | මෙය ලෙජර් ගිණුම් රාශියකට අදාල ශුද්ධ ලැබීම්වල එකතුවක් වන අතර ඒ සඳහා උපලේඛණයක් සකස් කිරීමේ ප්‍රායෝගික ගැටළුවක් පවතින බව. කෙසේ වෙතත් ඉදිරියේදී මෙම ශුද්ධ ලැබීම් සඳහා උපලේඛනයක් සකස් කර ඉදිරිපත් කිරීමට අවශ්‍ය කටයුතු කරුනු ලබන බව. | මූල්‍ය ප්‍රකාශනයන්හි සඳහන් අගයන් සනාථ කිරීමට අවශ්‍ය සාක්ෂි විගණනයට ඉදිරිපත් කිරීමට ඉදිරි පියවර ගත යුතු වීම. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ)අදාල බදුකුලී ගිවිසුම් | - | විශ්වවිද්‍යාලය තුළ පවත්වාගෙන යනු ලබන යුනි කන්සල්ටන්සි නමින් වන පෞද්ගලික ආයතනයට විශ්වවිද්‍යාලය විසින් මාසිකව කුලී පදනමට ලබාදී තිබූ ගොඩනැගිල්ලට අදාල බදුකුලී ගිවිසුම් | UNIC ආයතනය විසින් දැනට මොරටුව විශ්වවිද්‍යාලය වෙත රු.30,000 ක මුදලක් මාසිකව ගෙවුන ලබන අතර එය තහවුරු කිරීම සඳහා වැඩ ඉංජිනේරු මොරටුව විශ්වවිද්‍යාලය මගින් යුනිකන්සල්ටන්සි සර්විස් හි අධ්‍යක්ෂ වෙත යවන ලද 2015.05.16 දරන ලිපිය ඉදිරිපත් කළ බව. | මූල්‍ය ප්‍රකාශනයන්හි සඳහන් අගයන් සනාථ කිරීමට අවශ්‍ය සාක්ෂි විගණනයට ඉදිරිපත් කිරීමට ඉදිරි පියවර ගත යුතු වීම. |
| (ඇ) පුනරුත්ථාපන හා වැඩිදියුණු කිරීම් ව්‍යාපෘතිවල විවිධ වැඩ සඳහා වෙන්කල මුදල් | **39,344,250** | ක්‍රියාත්මක වූ ව්‍යාපෘති පිළිබඳ ලිපි ගොනු | පිළිතුරු ලබා දී නැත. | මූල්‍ය ප්‍රකාශනයන්හි සඳහන් අගයන් සනාථ කිරීමට අවශ්‍ය සාක්ෂි විගණනයට ඉදිරිපත් කිරීමට ඉදිරි පියවර ගත යුතු වීම. |

**1.6 සම්බන්ධිත පාර්ශවයන් හා සම්බන්ධිත පාර්ශව ගනුදෙනු හෙළිදරව් නොකිරීම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විශ්වවිද්‍යාලය තුළ පිහිටුවා ඇති යුනි කන්සල්ටන්සි සමාගමේ ව්‍යවස්ථාවලියෙහි, පාලක මණ්ඩලයේ සාමාජිකයන් දෙදෙනෙකු ලෙස විශ්වවිද්‍යාලයේ මූල්‍යාධිකාරී සහ ලේඛකාධිකාරී නම් කර තිබුණි. | පිළිතුරු ලබා දී නැත. | සම්බන්ධිත පාර්ශව ගනුදෙනු හෙළිදරව් කිරීමට පියවර ගත යුතුවීම. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ)ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 21(ආ) | මුදල් රෙගුලාසිය ප්‍රකාරව, ඒකක පිරිවැය රු.5,000,000 ඉක්මවන ඇස්තමේන්තුගත ව්‍යාපෘති හෝ වැඩ විෂයයන් සාමූහික ප්‍රතිපාදන ලෙස නොව වෙන වෙනම විෂයගත කොට ඇස්තමේන්තුවල පෙන්නුම් කළයුතු වුවද, 2018 වර්ෂයේ පුනරුත්ථාපන හා වැඩිදියුණු කිරීම් ව්‍යාපෘතිය යටතේ රු. මිලියන 42.06 ක් වූ විවිධ වැඩ සාමූහික ප්‍රතිපාදන ලෙස ඇස්තමේන්තුවල ඉදිරිපත් කර තිබුණි. | පිළිතුරු ලබාදී නැත. | අදාල නීති,රීති අනුව කටයුතු කළ යුතුවීම. |
| (ආ) 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය | චක්‍රලේඛයට අනුව ආයතනය සතුව පවතින ස්ථාවර වත්කම් සම්බන්ධ සියළු විස්තර ඇතුළත් කරමින් ස්ථාවර වත්කම් ලේඛණයක් පවත්වා ගෙන යා යුතු වුවද එවැනි ලේඛණයක් විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි. | විශ්වවිද්‍යාලය විසින් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන යනු ලැබේ. | ස්ථාවර වත්කම් ලේඛනයක් පිළියෙල කර එය යාවත්කාලීනව පවත්වා ගත යුතුය. |
| (ඇ) 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය | චක්‍රලේඛය ප්‍රකාරව පරිගණක උපාංග සහ මෘදුකාංග සම්බන්ධයෙන් වෙනම ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා ගෙන ගොස් නොතිබුණි. | සියළුම පීය, දෙපාර්තමේන්තු හා අංශ විසින් වත්කම් ලේඛන නඩත්තු කරන අතර එහිදී එම වත්කම් ලේඛන තුල මෙම පරිගණක උපාංග හා මෘදුකාංග මිලදී ගැනීම, භාරකාරත්වය, අපහරණය සම්බන්ධ තොරතුරු යාවත්කාලීන කරනු ලැබේ. | අදාල චක්‍රලේඛය ප්‍රකාරව වත්කම් ලේඛනයක් පවත්වා ගෙන යා යුතුය. |
| (ඈ) විශ්වවිද්‍යාල කොමිෂන් සභා මූල්‍ය චක්‍රලේඛ ලිපි අංක 05/2017 | වාර්ෂික අයවැය හරහා විශ්වවිද්‍යාලයේ ප්‍රාග්ධන ව්‍යාපෘති වෙනුවෙන් අරමුදල් වෙන්කිරීම් ක්‍රියාවලියේදී විශ්වවිද්‍යාල කොමිෂන් සභා මූල්‍ය චක්‍රලේඛ ලිපි අංක 05/2017 හි (3) පරිච්ඡේදයේ නියාමනයන්ගෙන් බැහැරව ක්‍රියාකර ඇති බවත් ප්‍රාග්ධන ව්‍යාපෘති වෙනුවෙන් මූල්‍ය වෙන්කිරීමේ ක්‍රියාවලිය නිසි අධීක්ෂණයකින් හා විනිවිදභාවයකින් ක්‍රියාත්මක වී නොමැති බවත් නිරීක්ෂණය විය. | පිළිතුරු ලබාදී නැත. | අදාල චක්‍රලේඛ අනුව ක්‍රියා කළ යුතුවීම. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.98,671,571 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 58,682,610 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 39,988,961 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට වර්ෂයේ ආදායම රු.517,089,535 කින් වැඩිවී තිබුණ ද වර්ෂයේ වියදම රු. 557,078,496 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

**2017 වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ආයෝජන මත පොළී ආදායම සියයට 69 කින් ද කාර්ය මණ්ඩල වේතන සියයට 23කින් ද ඉහළ ගොස් තිබුණි.**

### 2.3 අනුපාත විශ්ලේෂණය

(අ) ජංගම වත්කම් අනුපාතය

පසුගිය වර්ෂයේ 0.38 ක් වූ ජංගම අනුපාතය ප්‍රවර්තන වර්ෂයේ 0.33 ක් වී පැවතුනි.

(ආ) ක්ෂණික වත්කම් අනුපාතය

පසුගිය වර්ෂයේ ක්ෂණික වත්කම් අනුපාතය 0.35 ක් ව පැවති අතර ප්‍රවර්තන වර්ෂයේ එම අනුපාතය 0.31 ක් වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) අධ්‍යයන නිවාඩු ලබා විදේශගතවූ ආචාර්යවරුන් 32 දෙනෙකු අදාළ ගිවිසුම් හා බැඳුම්කර කඩකිරීම හේතුවෙන් 2018 දෙසැම්බර් 31 දින වනවිට රු.61,422,362 ක් අයවීමට තිබුණි. ඉන් වසර 10 ක් ඉක්මවූ නිලධාරීන් 06 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු.1,473,002 ක් හා නිලධාරීන් 18 දෙනෙකුගෙන් අයවිය යුතු මුදල රු.29,003,867 ක් අයකර ගැනීම සඳහා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට කිසිඳු පියවරක් ගෙන නොතිබුණි. නිලධාරීන් 08 | ගිවිසුම් හා බැඳුම්කර කඩකළ නිලධාරීන්ගෙන් අයවිය යුතු මුදල් අයකර ගැනීමට ඉදිරිපත් කර ඇති ඇමුණුම අනුව පියවර ගෙන ඇත. | ගිවිසුම් හා බැඳුම්කර කඩකළ නිලධාරීන්ගෙන් අයවිය යුතු මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| දෙනෙකුගේ එකතුව රු.20,808,390 ක් විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලින් අයකරගැනීම සඳහා යොමුකර වසරකට වැඩි කාලයක් ගතවී තිබුණද එය අයකර ගැනීම සඳහා ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි. | | |
| (ආ) විදේශ අධ්‍යයන නිවාඩු ලැබූ ආචාර්යවරයෙකු ගිවිසුම කඩ කිරිම හේතුවෙන් අයවිය යුතු රු.4,093,176 ක් ඇපකරුවන්ගෙන් අයකර ගැනීම සඳහා පැවරූ නඩුවකදී ප්‍රධාන ගිවිසුම අත්සන් කිරීමට පෙර ඇප ගිවිසුම් අත්සන් කිරීම සහ ඉලක්කමින් ලියූ වටිනාකම සනාථ කිරීමට විශ්වවිද්‍යාලය අපොහොසත් වීම යන කරුණු හේතුවෙන් ඇපකරුවන් වගකීමට නොබැඳෙන බව අධිකරණ තීන්දුව මගින් ප්‍රකාශයට පත්කර නඩුව නිශ්ප්‍රභා කර තිබුණි. විශ්වවිද්‍යාලයෙහි වගකිව යුතු නිලධාරීන් විසින් වගකීමකින් තොරව කටයුතු කිරීම හේතුවෙන් විශ්වවිද්‍යාලයට අයවිය යුතු මුදල් අයකර ගත නොහැකිවී තිබුණි. | මෙම ගිවිසුම අත්සන් කරන අවස්ථාවේදී විශ්වවිද්‍යාලයේ සේවයකල අදාළ වගකිව යුතු පුද්ගලයින් දැනට මොරටුව විශ්වවිද්‍යාලයේ සේවයෙන් බැහැරව ගොස් ඇති බව හා ඒ පිළිබඳව තීරණයක් ගැනීමට මොරටුව විශ්වවිද්‍යාලයට නොහැකි වී ඇත. | ගිවිසුම් අත්සන් කිරීමේදී වගකීමකින් යුතුව කටයුතු කළ යුතුය. |
| (ඇ) යුනි කන්සක්ටන්සි සමාගමට නෛතික රාමුවක් ඇතිකර ගැනීම සඳහා පොදු ව්‍යාපාර කාරක සභාව විසින් විශ්වවිද්‍යාලයට කැබිනට් අනුමතියක් ලබා ගන්නා ලෙස නියෝග කර ඇති නමුත් විගණිත දිනය වූ 2019 මැයි 16 දින විටත් එසේ කර නොතිබුණි. | UNIC ආයතනය සමග මොරටුව විශ්වවිද්‍යාලය අත්සන් කිරීමට නියමිතව තිබූ ගිවිසුම 2019.05.16 දින අත්සන් කරන ලද අතර කැබිනට් අනුමැතිය ගැනීම සඳහා මේ වනතුරු පියවර ගෙන නොමැති බව. | කැබිනට් අනුමැතිය ලබා ගැනීමට ක්‍රියා කල යුතුය. |

**3.2 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

-------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ)විශ්වවිද්‍යාලයට Lease Line Access පහසුකම ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය මගින් ලබාගැනීමට ඇති හැකියාව පිළිබඳ නිසි ඇගයීමක් නොකර විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ උපසභාපති හා තවත් විශ්වවිද්‍යාල ආචාර්යවරු සාමාජිකත්වය දරණ LEARN නැමැති පෞද්ගලික සමාගමෙන් ලබාගෙන තිබුණි. ඒ වෙනුවෙන් 2016 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා පිළිවෙලින් රු.33,430,467 ක් රු.41,650,975 ක්, රු.47,215,767 ක් හා රු.34,188,337 ක් අදාල සමාගමට ගෙවා තිබුණි. | ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය මගින් ලබාදෙන Lease Line පහසුකම් තුල අධ්‍යාපනික වශයෙන් අවශ්‍යවන සේවාවන් හා පහසුකම් නොදෙන බව සහ LEARN ආයතනය මඟින් එම පහසුකම ලබා ගන්නා ලදි. | Lease Line Access පහසුකම ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය මගින් ඍජුවම ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) විශ්වවිද්‍යාලය සහ කෝඩ්ජෙන් ඉන්ටනැෂනල් සමාගම සමග - බුද්ධිමය දේපල සම්බන්ධයෙන් ඇති කර ගෙන ඇති ගිවිසුම පරීක්ෂාවට අනුව විශ්වවිද්‍යාලය විසින් බුද්ධිමය දේපළ සම්බන්ධයෙන් අනුමත කරගෙන ඇති ප්‍රතිපත්ති සංග්‍රහය පරිදි බුද්ධිමය දේපල අයිතිවාසිකම් විශ්වවිද්‍යාලය විසින් රඳවා ගතයුතු වුවද ඊට අනුකූල නොවන ලෙස විශ්වවිද්‍යාලයට කිසිම මූල්‍ය ප්‍රතිලාභයක් නොමැතිව කෝඩ්ජෙන් ඉන්ටනැෂනල් සමාගම සමඟ ගිවිසුමකට එළඹ තිබුණි. | මෙම ගිවිසුම මොරටුව විශ්වවිද්‍යාලයේ බුද්ධිමය දේපල සඳහා වූ ප්‍රතිපත්ති සංග්‍රහයට අනුකූලව පිළියෙල කර පාලක සභාවේ අනුමැතිය ඇතිව අදාළ ගිවිසුමට එළඹ ඇති බව. | බුද්ධිමය දේපල අයිතිවාසිකම් විශ්වවිද්‍යාලය විසින් රඳවා ගැනීමට පියවර ගත යුතු අතර ගිවිසුමකට එළඹීමේදී ප්‍රථිඵලය විශ්වවිද්‍යාලය කෙරෙහි වාසිදායක ද යන්න සොයාබලා කටයුතු කිරීමට පියවර ගත යුතු වීම. |

| | | |
|---|---|---|
| (ඇ) නව ආපනශාලා සංකීර්ණය සඳහා අවශ්‍ය පුටු හා මේස රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියාවලියෙන් බැහැරව කුලී පදනම මත ලබා ගෙන තිබීම හේතුවෙන් විශ්වවිද්‍යාලයට රු. 745,920 ක මූල්‍ය අලාභයක් සිදුවී තිබූ අතර ඒ සම්බන්ධයෙන් සිදු කරන ලද මූලික විමර්ෂණයේදී චෝදනා වලට ලක්ව සිටි නිලධාරීන් නිදහස් කිරීමට තරම් සාක්ෂි ඉදිරිපත් කර නොතිබුන ද 2017 ජනවාරි 04 දිනැති 431 සහ 2018 ඔක්තෝබර් 10 දිනැති 453 පාලක සභා තීරණ මගින් සියළුදෙනා චෝදනා වලින් නිදහස් කර තිබුණි. | එකඟ වන බව. | පවත්නා නීති, රීති වලට අනුව කටයුතු කළ යුතු වීම. |

**3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

---------------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශයෙන් රු.මිලියන 15 ක් සහ ජාතික විද්‍යා පදනමෙන් රු.මිලියන 25 ක මූල්‍ය දායකත්වයෙන් මොරටුව විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු නිර්මාණ අංශයට පරිත්‍යාග සේ ලැබුණු රු.මිලියන 40 ක් වටිනාකමැති Digital Rapid Prototyping and Manufacturing System Viper යන්ත්‍රය 2015 වර්ෂයේ සිට විගණිත දිනය වූ 2019 ජනවාරි 11 දින දක්වා ඌන උපයෝජිතව පැවතුණ අතර නියමිත කාලයට සේවා නඩත්තු නොකිරීම හේතුවෙන් යන්ත්‍රය අක්‍රීය තත්ත්වයට පත්වී තිබුණි. | යන්ත්‍රයේ නඩත්තු පිරිවැය සඳහා පමණක් රු.1,200,000 මුදලක් අවශ්‍යව තිබූ අතර නිර්මාණ මධ්‍යස්ථානයේ සේවක වැටුප් සඳහා ප්‍රතිපාදන වෙන්කිරීමටද මුදල් අවශ්‍ය වී තිබුණි. වසර 5 ක මුළු ඉපයුම නඩත්තු කටයුතු සඳහා පමණක් ප්‍රමාණවත් විය. ප්‍රවර්ධන කටයුත සඳහා අමතර ආදායමක් නොලැබුණු බව, ඉංජිනේරු නිර්මාණ මධ්‍යස්ථානය වසා දැමීම විශ්වවිද්‍යාල පරිපාලනය විසින් සිදු කරන ලද බව හා මොරටුව විශ්වවිද්‍යාල ඉංජිනේරු නිර්මාණ මධ්‍යස්ථාන කළමනාකාර මණ්ඩලය හා ඉංජිනේරු පීඨ සභාවේ නිර්දේශය මත පාලන සභාවේ අනුමැතිය ඇතිව සහ නියමිත පටිපාටියට යටත්ව බව . | Digital Rapid Prototyping and Manufacturing System Viper යන්ත්‍රය නැවත ක්‍රියාත්මක තත්ත්වයට ගෙන ඒමට පියවර ගත යුතු අතර ඒ සම්බන්ධව උපදේශකවරයෙකුගේ උපදෙස් ලබා ගැනීමකින් ඉදිරි ක්‍රියාමාර්ග සැළසුම් කළ යුතු වීම සහ ඒ සම්බන්ධව අදාල යන්ත්‍රය ලබා දුන් ආයතන දැනුවත් කිරීමට පියවර ගත යුතුය. |
| (ආ) 2014 රජයේ ප්‍රතිපාදන මගින් ලබාදී තිබූ රු.මිලියන 143.9 ක ඇස්තමේන්තුගත වටිනාකමකට ඉදිකර තිබුණු වාස්තු විද්‍යා දේශනශාලා ගොඩනැගිල්ල විගණිත දිනය වූ 2019 පෙබරවාරි 28 දින වන විටද ප්‍රයෝජනයට ගෙන නොතිබුණි. | මූල්‍ය ප්‍රතිපාදන නොමැති වීම හේතුවෙන් අසම්පූර්ණ වූ වැඩ කොටස් වන අභ්‍යන්තර බෙදීම් (Interior Partitioning) සිවිලිම්, වැසිකිළි විදුලිය හා ජල සැපයුම් වැනි අත්‍යාවශ්‍ය කොටස් නිසා ඉදිකළ ගොඩනැගිලි භාවිතයට ගැනීමටද නොහැකි වූ බව. | වාස්තු විද්‍යා දේශනශාලා ගොඩනැගිල්ල දේශන සඳහා යෙදවීමට පියවර ගත යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) විශ්වවිද්‍යාලයේ ආපනශාලා තුළින් බැහැර කරන අපද්‍රව්‍ය මගින් ජීව වායුව නිෂ්පාදනය කර එම වායුව ආපනශාලාවල ආහාර පිසීම සඳහා භාවිතා කිරීම වෙනුවෙන් 2016 වර්ෂයේදි ආරම්භ කළ ජීව වායු පද්ධතිය ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතිය සඳහා සමාලෝචිත වර්ෂය අවසාන වනවිට රු.මිලියන 1.3 ක් ගෙවා තිබුණ නමුත් ඉදිකිරීම් දෝෂ නිසා තවදුරටත් නිශ්ක්‍රීයව පැවතුණි. | ඉදිරියේදී ජීව වායු පද්ධතියේ ධාරිතාව වැඩිවන අයුරින් පද්ධතිය නැවත වැඩිදියුණු කිරීමටත් යෝජනා වී ඇත. | ජීව වායු පද්ධතිය ප්‍රයෝජනයට ගත හැකි අයුරින් සකස් කර භාවිතයට ගැනිමට කටයුතු කළ යුතුය. |

## 3.4 ව්‍යාපෘති හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මුල් ඇස්තමේන්තුව රු. මිලියන 159.7 ක් වූ බහු කාර්ය සඳහා වූ ඉංජිනේරු පීඨ ගොඩනැගිල්ල ඉදිකිරීම 2014 වර්ෂයේ ආරම්භ කර අවසන් කළ යුතුව තිබුණේ 2015 පෙබරවාරි 25 දිනදීය. කොන්ත්‍රාත්තුව 2016 දෙසැම්බර් 25 දින තවදුරටත් ඉටු කළයුතු වැඩ කොටස් තිබියදී විශ්වවිද්‍යාලයට භාරදී තිබුණි. ඒ වනවිට ගොඩනැගිල්ල සඳහා | යෝජිත ගොඩනැගිලි ඉදිකිරීම් හා අදාල ප්‍රසම්පාදන කටයුතු වලදී ඒවා සඳහා අනුමත වූ මුල්‍ය ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවුණු බවත් එම ව්‍යාපෘතීන් හා විෂය පථයෙහි වෙනස්කම්ද සිදු කර ඇත. එසේ මූල්‍ය ප්‍රතිපාදන නොමැති විම හේතුවෙන් අසම්පූර්ණ වූ වැඩ කොටස් වන අභ්‍යන්තර බෙදීම් (Interior Partitioning) සිවිලිම්, වැසිකිළි විදුලිය හා ජල සැපයුම් වැනි අත්‍යාවශ්‍ය කොටස් නිසා ඉදිකළ ගොඩනැගිලි භාවිතයට ගැනීමටද නොහැකි වී ඇත. | ඉතිරි වැඩ සම්පූර්ණ කර ගොඩනැගිල්ල ප්‍රයෝජනයට ගැනීමට පියවර ගත යුතුය. |
| රු. මිලියන 168.2 ක් ගෙවා තිබුණ ද මෙම ඉතිරි වැඩ සම්පූර්ණ කර නොතිබීම හේතුවෙන් ගොඩනැගිල්ල ප්‍රයෝජනයට ගැනීමට නොහැකිවී තිබුණි. | ඉතිරි වැඩ කටයුතු සඳහා 2019 ජනවාරි මස 21 දින අමාත්‍ය මණ්ඩල තීරණය ලැබී ඇති අතර උපදේශන සේවාව ලබා ගැනීම සඳහා විවෘත තරඟකාරී ලංසු ක්‍රමය අනුගමනය කරන ලෙසද එකී අනුමැතියෙහි උපදෙස් දී ඇත. ඒ අනුව මේ වන විට උපදේශන සේවා සැපයීම සඳහා ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කර ඇත. | |
| (ආ) කාර්මික ඉංජිනේරු ගොඩනැගිල්ලට ඉදිරියෙන් දිවා සුරුකුම් මධ්‍යස්ථානය දක්වා වන උද්‍යාන අලංකරණයෙහි කොන්ත්‍රාත්තුව වෙනුවෙන් රු.3,093,310 ක් වැයකර තිබුණද විගණිත දිනය වූ 2019 මැයි 31 දින දක්වාම අලංකරණ කටයුතු නිමකර නොතිබුණි. | මෙම ව්‍යාපෘතියේ අදියර I ලෙස සිදුකරන ලද අතර එහි ඉදිරි කටයුතු අදියර II මඟින් කිරීමට නියමිත වේ. | අදාල කාර්යය ඉටුවන පරිදි මුදල් වැයකල යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) 2013 වර්ෂයේ ක්‍රීඩා පිටි සංවර්ධනය කිරීම සඳහා රු. මිලියන 30 ක් වැය කර ඇතත් මේ දක්වා අදාල කාර්යයන් නිසි ලෙස නිම නොකිරීම නිසා පුහුණුවීමට හා තරඟ පැවැත්වීමට බාහිර ක්‍රීඩා පිටි කුලියට ගැනීමට සිදුවී තිබුණි. | බාහිර පැසිපන්දු ක්‍රීඩාපිටිය තවමත් සම්පූර්ණයෙන්ම නිම කර නොමැති බැවින් ක්‍රීඩකයන්ට අවශ්‍ය පරිදි පුහුණු අවස්ථා සලසා දීමට විශ්වවිද්‍යාලය මඟින් කටයුතු කර ඇත. | අදාල අරමුණ ඉටුකර ගැනීම සඳහා ඵලදායී ලෙස මුදල් වැයකල යුතුය. |

**3.5 ප්‍රසම්පාදන කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ද්‍රව්‍ය විද්‍යා සහ ඉංජිනේරු දෙපාර්තමේන්තු ගොඩනැගිල්ල (Material Science and Engineering Department Building) ඉදිකිරීම සඳහා Design and Build පදනම මත අවශ්‍ය ලංසු ලියවිලි සකස් කිරීම දැනුවත් පුද්ගලයන් විශ්වවිද්‍යාලය තුළ සිටියදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ උපදෙස්වලට පටහැනිව රු.752,000 ක් වැය කර පිටස්තර ආයතනයකින් එම සේවාව ලබා ගෙන තිබුණි. | විශ්වවිද්‍යාලයේ ආචාර්ය මණ්ඩලය මෙවන් උපදේශන සේවාවන් සැපයීම අනුමත කළ ප්‍රතිපත්ති මාලාවක් (Policy) අනුව සිදු කෙරෙන බව හා ආයතනය තුළ ක්‍රියාත්මක වන ව්‍යාපෘති සඳහා එම ප්‍රතිපත්ති මාලාවට අනුකූල නොවන සේ සිය සේවා ලබාදීමට ආරාධනා කිරීම අපහසු වීම. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ උපදෙස්වලට අනුව ක්‍රියා කිරීමට කටයුතු සැළසුම් කළ යුතුවීම. |

**3.6 මානව සම්පත් කළමනාකරණය**

**පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කාර්යමණ්ඩලයේ පුරප්පාඩු 426 ක් ව පැවතුණු අතර එම පුරප්පාඩු සඳහා කොන්ත්‍රාත් පදනම මත 101 දෙනෙක් බඳවා ගෙන තිබුණි. අධ්‍යයන කාර්යමණ්ඩල පුරප්පාඩු යටතේ ආචාර්යවරුන්ගේ පුරප්පාඩු 224 ක් වූ අතර ඒ වෙනුවෙන් බාහිර කථිකාචාර්යවරන් බඳවා ගෙන තිබූ අතර 2018 වර්ෂය තුළ ඒ සඳහා රු.36,872,411 ක මුදලක් ගෙවා තිබුණි. | අධ්‍යයන හා අනධ්‍යයන සහායක පුරප්පාඩු අදාළ අංශ වල අංශ ප්‍රධානීන්ගේ ඉල්ලීම් වලට අනුව පිරවීමට කටයුතු කරන බව හා අනධ්‍යයන සේවක පුරප්පාඩු උසස් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ලැබෙන ලැයිස්තු මඟින් පිරවීම සඳහා කටයුත කරනු ලබන බව. | පුරප්පාඩු පිරවීමට කඩිනමින් පියවර ගත යුතුවීම. |
| (ආ) 2018 දෙසැම්බර් 31 දිනට විශ්වවිද්‍යාලයේ අනුමත අනධ්‍යයන කාර්යමණ්ඩලය 878 ක් සහ තත්‍ය කාර්යමණ්ඩලය 710 ක් වීමෙන් පුරප්පාඩු 168 ක් පැවතුණි. එම පුරප්පාඩු සඳහා කොන්ත්‍රාත් පදනම මත 105 දෙනෙක් බඳවා ගෙන තිබුණ ද විශ්වවිද්‍යාලයේ අංශ 21 ක තවදුරටත් කාර්මික නිලධාරී තනතුරුවල පුරප්පාඩු 44 ක් පැවතුණි. | | පුරප්පාඩු පිරවීමට කඩිනමින් පියවර ගත යුතුවීම. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) විශිෂ්ඨතම උසස් අධ්‍යාපන මධ්‍යස්ථානයක් ලෙස ජාත්‍යන්තර අනන්‍යතාවයන් ළඟාකර ගැනීමේ අරමුණින් විශ්වවිද්‍යාලය සිය මෙහෙයුම් කටයුතු ක්‍රියාත්මක කිරීමේදී 2018 වර්ෂයේදී ලෝක ශ්‍රේණිගත කිරීම්වල Webometrics ranking 2018 දී අපේක්ෂිත මට්ටම 2200 ක් වුව ද ළඟා කරගත් මට්ටම 2713 ක් ලෙස ද QS Asia rankingවල මට්ටම 2018 දී අපේක්ෂිත මට්ටම 250 වුව ද ළඟා කරගත් මට්ටම 291 – 300 ක් ලෙස ද පැවතුණි. | ලෝක විශ්වවිද්‍යාල ශ්‍රේණිගත කිරීම් යටතේ මොරටුව විශ්වවිද්‍යාලයේ ශ්‍රේණිගත කිරීම වැඩිදියුණු කිරීම සඳහා 2018 වර්ෂයේදී පහත ක්‍රියාමාර්ග ගෙන ඇත. | විශ්වවිද්‍යාල වෙබ් අඩවිය පරිහරණය කරන පිරිස වැඩිකර ගැනීමේ අවශ්‍යතාව වැඩිදියුණු කිරීම සඳහා ක්‍රියාකළයුතුයි. |
| (ආ)සමාලෝචිත වර්ෂයේ විශ්වවිද්‍යාලයීය දේශීය හා විදේශීය සිසුන්ගේ අපේක්ෂිත වර්ධනය ළඟා කර ගැනීමට ක්‍රියාකාරී සැලැස්මෙන් අපේක්ෂිත දේශීය හා විදේශීය සිසුන් පිළිවෙලින් 400 ක් හා 25 ක් වුව ද තත්‍ය වශයෙන් පර්යේෂණවල නිරත සංඛ්‍යාව දේශීය හා විදේශීය සිසුන් පිළිවෙලින් 108 දෙනෙකු හා විදේශීය සිසුන් එක් අයෙකු පමණක් විය. | ක්‍රියාකාරී සැලැස්මට අනුව පර්යේෂණවල නිරතවීමට අපේක්ෂිත දේශීය සිසුන් හා විදේශ සිසුන්ගේ ප්‍රමාණය ලබා කර ගැනීම සඳහා පියවර ගනු ලැබූ අතර ඉදිරියේදී දේශීය හා විදේශ සිසුන් පර්යේෂණ සඳහා දිරිගැන්වීමේ නව ක්‍රම ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වේ. | සිසුන් පර්යේෂණ වලට යොමු කිරීම වැඩි කිරීමට වැඩපිළිවෙලක් ඇති කළ යුතුය. |
| (ඇ) සමාලෝචිත වර්ෂය තුළ ප්‍රකාශයට පත් කරන පර්යේෂණ සඟරා ගණන 281 ක්ද, සම්මේලන/ සම්මන්ත්‍රණයන්හිදී ඉදිරිපත් කෙරෙන පර්යේෂණ ගණන 765 ක් දක්වා ද 2010 වර්ෂයේ සිට ලබාගත් පේටන්ට් බලපත්‍ර සංඛ්‍යාව 30 දක්වා ද වර්ධනය කර ගැනීමට ක්‍රියාකාරී සැලැස්මෙන් අපේක්ෂා කර තිබුණද ලඟාවී ඇති මට්ටම පිළිවෙලින් 26 ක් 55 ක් සහ 05 ක් වූ අවම මට්ටමක විය. | මොරටුව විශ්වවිද්‍යාලය විසින් දැනට ලබාගෙන ඇති පේටන්ට් බලපත්‍ර සංඛ්‍යාව දැක්වෙන ලියවිල්ල ඉදිරිපත් කර ඇත. | පර්යේෂණ දායකත්වය ඉහළ නැංවීමට කටයුතු කළ යුතුය. |

## 4.2 ප්‍රසම්පාදන සැලැස්ම

| | | |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්මෙහි අන්තර්ගත නොවුණු රු. මිලියන 12.8 ක් වූ කොන්ත්‍රාත් 09 ක් වර්ෂය තුළදී ක්‍රියාත්මක කර තිබූ අතර රු. මිලියන 41.17 ක් වූ කොන්ත්‍රාත් 37 ක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබූ නමුත් ක්‍රියාත්මක කර නොතිබුණි. | ඉදිකිරීම් ව්‍යාපෘති, පුනරුත්ථාපන හා වැඩිදියුණු කිරීම් ව්‍යාපෘති බොහෝ විට මුදල් වර්ෂයන් කිහිපයක් තුළ ක්‍රියාත්මක වේ. යම් වර්ෂයක් සඳහා විශ්වවිද්‍යාලය වෙත වෙන් කරනු ලබන සම්පූර්ණ ප්‍රාග්ධන ප්‍රතිපාදනයම නිදහස් කරන්නේ නම් යම් ව්‍යාපෘතියක් සඳහා වන පිරිවැය ඇස්තමේන්තුව/ කොන්ත්‍රාත් මුදල එම ව්‍යාපෘතිය වෙනුවෙන් වෙන්කර තැබිය හැකිය. එහෙත් මෙම ව්‍යාපෘති වර්ෂ කිහිපයක් තුළ ක්‍රියාත්මක වන බැවින් එය වර්ෂ කිහිපයක ප්‍රසම්පාදන සැලැස්ම තුළ නිරූපණය විය හැකිය. | වර්ෂය තුළ ක්‍රියාත්මක කල හැකි ව්‍යාපෘතීන් හඳුනාගෙන සැලැස්ම පිළියෙල කල යුතුය. |

## 4.3 තිරසාර සංවර්ධන අරමුණු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 න්‍යාය පත්‍රය ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාලව විශ්වවිද්‍යාලය විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් දැනුවත් වී තිබුණද එය කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කිරීමට පියවර ගෙන ඇත. | අදාල කාර්යයන් වර්ෂයේ ක්‍රියාකාරී සැලස්මට ඇතුළත් කල යුතු ය. |